සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

2019.08.26 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය** ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්**

- **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

**1.** සීමිත සනුග පොදු සමාගමේ 2019.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| **විස්තරය** | **හර (රු. '000)** | **බැර (රු. '000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 90 000 | |
| 2018.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ මත සමුච්චිත ක්ෂය ....... | | 15 000 |
| විකුණුම් ........ | | 88 000 |
| විකුණුම් පිරිවැය ........ | 45 000 | |
| තොගය ........ | 4 200 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ ........ | 17 300 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ ........ | | 19 000 |
| කල්බදු ගෙවීම් ........ | 3 750 | |
| මුදල් සහ මුදල් සමාන දෑ ........ | 750 | |
| 2018.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන ........ | | 580 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් ........ | | 45 500 |
| 2018.04.01 දිනට රඳවාගත් ඉපැයුම් ........ | | 6 395 |
| පරිපාලන වියදම් ........ | 4 500 | |
| බෙදාහැරීමේ පිරිවැය ........ | 5 200 | |
| මූල්‍ය වියදම් ........ | 750 | |
| වෙනත් වියදම් ........ | 1 800 | |
| ආදායම් බදු ගෙවීම් ........ | 1 950 | |
| 2018.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන ........ | | 725 |
| | **175 200** | **175 200** |

[ දෙවැනි පිටුව බලන්න.

**අතිරේක තොරතුරු:**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ද සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) පරිපාලන වියදම් තුළ රු. 900 000 ක අධ්‍යක්ෂ ගාස්තු ඇතුළත් වේ. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන ගාස්තුව රු. 250 000 ක් වූ අතර එය වර්ෂය අවසන් වන විට ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(ii) සමාගමට එරෙහිව ගනුදෙනුකරුවකු පවරා තිබූ නඩුවක තීන්දුව 2019.05.10 දින ප්‍රකාශයට පත් කරන ලද අතර ඒ අනුව එදිනම ගනුදෙනුකරුට රු. 600 000 ක වන්දියක් ගෙවන ලදී. මෙම නඩුව 2019.01.01 දින පවරා තිබුණි. කෙසේ වුව ද සමාගම මෙම වන්දි සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් 2019.03.31 දිනට හඳුනාගෙන නොතිබුණි. 2019.05.30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

(iii) සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබන අතර පසුගිය වර්ෂය තුළ දී සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් රු. 470 000 ක වගකීම් සහතික වියදම් ප්‍රවර්තන වර්ෂයේ දී ගෙවා ඇත. මෙය ප්‍රවර්තන වර්ෂයෙහි බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත. 2019.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රු. 650 000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

(iv) 2018.04.01 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹුනු අතර වසර 5 ක කාලයක් සඳහා මෝටර් රථයක භාවිත අයිතිය ලබා ගන්නා ලදී. 2018.04.01 දිනට මෝටර් රථයේ භාවිත අයිතියේ පිරිවැය සහ එහි ඵලදායි ජීව කාලය පිළිවෙළින් රු. 5 960 000 ක් සහ වසර 5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කල්බදු ගිවිසුමට අනුව 2018.04.01 දින මූලික ගෙවීම ලෙස රු. 2 500 000 ක් ගෙවූ අතර 2019.03.31 දින ප්‍රථම වාර්ෂික වාරිකය ලෙස රු. 1 250 000 ක් ගෙවන ලදී. මූලික මිනුම් කිරීමේ දී කල්බදු වගකීම රු. 3 460 000 ක් විය. 2019.03.31 සහ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා කල්බදු පොලිය පිළිවෙළින් රු. 346 000 ක් සහ රු. 256 000 ක් වේ. සමාගම විසින් ගෙවන ලද මූලික ගෙවීම සහ ප්‍රථම කල්බදු වාරිකය පමණක් කල්බදු ගෙවීම් ගිණුමේ සටහන් කර තිබුණි. මේ සම්බන්ධව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(v) දේපළ, පිරියත සහ උපකරණවල සංයුතිය සහ ඒවායෙහි සමුච්චිත ක්ෂය පහත පරිදි වේ:

| **විස්තරය** | **2019.03.31 දිනට පිරිවැය/අගය (රු.'000)** | **2018.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු.'000)** |
|---|---|---|
| ඉඩම් | 30 000 | |
| ගොඩනැගිලි | 45 000 | 11 000 |
| කාර්යාල උපකරණ | 15 000 | 4 000 |
| | 90 000 | 15 000 |

(vi) ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය මෙතෙක් වෙන් කර නොමැත. කල්බදු පදනම මත ලබා ගත් මෝටර් රථය බෙදාහැරීමේ කටයුතු සඳහා භාවිත කරනු ලබන අතර ගොඩනැගිලි සහ කාර්යාල උපකරණ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ. කාර්යාල උපකරණ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් ක්ෂය කරනු ලබයි. මෝටර් රථයේ සුන්බුන් අගය ශුන්‍ය බව උපකල්පනය කරන්න.

(vii) ප්‍රවර්තන වර්ෂය තුළ දී අත්පත් කරගත් දේපළ, පිරියත සහ උපකරණ පහත පරිදි වේ.

- 2018.07.01 දින : පිරිවැය රු. 10 000 000 ක ඉඩමක්
- 2018.10.01 දින : පිරිවැය රු. 5 000 000 ක කාර්යාල උපකරණ

මෙම අයිතම නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(viii) 2018.04.01 දින ගොඩනැගිලි රු. 38 000 000 කට දෙවන වරට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2014.03.31 දින ප්‍රථම වරට ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේ දී රු. 1 500 000 ක ඌනතාවයක් ඇති විය. දෙවන වර ප්‍රත්‍යාගණනයෙන් පසු ගොඩනැගිලිවල ඉතිරි ඵලදායි ජීව කාලය වසර 8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ගොඩනැගිලිවල සුන්බුන් අගය ශුන්‍ය බව උපකල්පනය කරන්න. දෙවන වර ප්‍රත්‍යාගණනයට අදාළව කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත.

(ix) වසර තුළ ගෙවූ ආදායම් බදුවල පෙර වර්ෂයට අදාළව ගෙවූ රු. 600 000 ක් ඇතුළත් වේ. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 1 920 000 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත.

(x) රු. 1 500 000 ක අතුරු ලාභාංශ ගෙවීම්, බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත. 2019.05.30 දින අධ්‍යක්ෂවරු විසින් රු. 1 000 000 ක අවසාන ලාභාංශයක් යෝජනා කරන ලදී.

[තුන්වැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සනුග පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(මුළු ලකුණු 40 යි)**

2. (අ) සීමිත දයාන් පොදු සමාගම XYZ නැමැති භාණ්ඩයක් නිෂ්පාදනය කරයි. මෙම භාණ්ඩයෙහි සතියක නිෂ්පාදනය ඒකක 300 සිට 500 අතර විචලනය වේ. එය A සහ B යන අමුද්‍රව්‍ය දෙක භාවිත කරමින් නිෂ්පාදනය කරයි. XYZ භාණ්ඩයෙහි එක් ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා A අමුද්‍රව්‍යයෙන් කිලෝ ග්‍රෑම් 10 ක් ද B අමුද්‍රව්‍යයෙන් කිලෝ ග්‍රෑම් 5 ක් ද අවශ්‍ය වේ. පහත තොරතුරු A සහ B අමුද්‍රව්‍යයන්ට අදාළ වේ.

| | A | B |
|---|---|---|
| යළි ඇණවුම් ප්‍රමාණය | 20 000 | ? |
| යළි ඇණවුම් මට්ටම | 18 000 | ? |
| උපරිම තොග මට්ටම | ? | 19 000 |
| අවම තොග මට්ටම | ? | 5 000 |
| **පොරොත්තු කාලය සතිවලින්:** | | |
| අවම | 2 | 3 |
| උපරිම | 4 | 5 |

**අවශ්‍යවන්නේ:**

(1) අමුද්‍රව්‍ය A සඳහා උපරිම සහ අවම තොග මට්ටම්

(2) අමුද්‍රව්‍ය B සඳහා යළි ඇණවුම් මට්ටම සහ යළි ඇණවුම් ප්‍රමාණය

(3) අමුද්‍රව්‍ය A සහ B සඳහා සාමාන්‍ය තොග මට්ටම්

**(ලකුණු 16 යි)**

(ආ) සීමිත කුමුදු පොදු සමාගම සතුව 'එකලස්' සහ 'නිමැවුම්' යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක ද 'ගබඩාව' යන සේවා දෙපාර්තමේන්තුව ද ඇත. ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

| **විස්තරය** | **එකතුව** | **එකලස්** | **නිමැවුම්** | **ගබඩාව** |
|---|---|---|---|---|
| සුපරීක්ෂක වැටුප් (රු.'000) | 1 690 | 530 | 730 | 430 |
| කුලිය (රු.'000) | 360 | ? | ? | ? |
| විදුලිය (රු.'000) | 180 | ? | ? | ? |
| ආරක්ෂක ගාස්තු (රු.'000) | 240 | ? | ? | ? |
| යන්ත්‍ර මත ක්ෂය (රු.'000) | ? | ? | ? | |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 18 000 | 9 000 | 6 000 | 3 000 |
| කිලෝවොට් පැය | 9 000 | 3 000 | 4 500 | 1 500 |
| ආරක්ෂක සේවක සංඛ්‍යාව | 12 | 5 | 3 | 4 |
| ශ්‍රම පැය | 21 000 | 7 000 | 14 000 | |
| යන්ත්‍ර පැය | 15 000 | 12 000 | 3 000 | |
| ඉදිරිපත් කරන ලද අමුද්‍රව්‍ය අධියාචනාපත්‍ර සංඛ්‍යාව | 50 | 30 | 20 | |

**අතිරේක තොරතුරු:**

(i) එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවල යන්ත්‍ර පිරිවැය පිළිවෙළින් රු. 450 000 ක් සහ රු. 800 000 ක් වේ. සමාගම විසින් යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලැබේ.

(ii) ගබඩා දෙපාර්තමේන්තුවේ මුළු පොදු කාර්ය පිරිවැය, එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු අතර එක් එක් දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කරන ලද අමුද්‍රව්‍ය අධියාචනාපත්‍ර සංඛ්‍යාව මත නැවත විභජනය කරනු ලැබේ.

(iii) පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම සඳහා එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය ද නිමැවුම් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය ද යොදා ගැනේ.

[හතරවැනි පිටුව බලන්න.

(iv) සමාගම විසින් මුළු නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් එකතු කර භාණ්ඩ විකුණනු ලැබේ. පහත තොරතුරු සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ABC සහ PQR යන භාණ්ඩ හා බැඳේ.

| | | ABC (ඒකකයක් සඳහා) | PQR (ඒකකයක් සඳහා) |
|---|---|---|---|
| ගත කළ සත්‍ය කාලය: | එකලස් දෙපාර්තමේන්තුව (යන්ත්‍ර පැය) | 2 | 4 |
| | නිමැවුම් දෙපාර්තමේන්තුව (ශ්‍රම පැය) | 3 | 2 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු.) | | ? | ? |
| ප්‍රාථමික පිරිවැය (රු.) | | 380 | ? |
| විකුණුම් මිල (රු.) | | ? | 1 200 |

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම් නම් කරමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (සේවා දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය පිරිවැය නැවත විභජනය ද ඇතුළත්ව)

(2) නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) ABC භාණ්ඩය සඳහා ඒකක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ ඒකක විකුණුම් මිල

(4) PQR භාණ්ඩය සඳහා ඒකක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ ඒකක ප්‍රාථමික පිරිවැය

**(ලකුණු 24 යි)**

**(මුළු ලකුණු 40 යි)**

**3.** කමල් විසින් 2018.04.01 දින ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරයේ 2019.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලද ශේෂයන් පහත දී ඇත.

| | රු.'000 |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 4 500 |
| තොගය (ගිණුම්කරණ වාර්තා මත පදනම්ව) | 600 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 820 |
| කලින් ගෙවූ කුලී | 480 |
| මුදල් ශේෂය | 610 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 100 |
| උපචිත වියදම් | 90 |
| ලද අත්තිකාරම් | 240 |
| 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 580 |
| 2018.04.01 දින හඳුන්වා දුන් ප්‍රාග්ධනය | 6 000 |

ව්‍යාපාරයෙහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලැබේ.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත අයිතම සැලකිල්ලට ගෙන නොමැති බව පසුව හෙළිදරව් විය.

(i) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය රු. 500 000 කි.

(ii) 2019 මාර්තු මාසය සඳහා ප්‍රදර්ශනාගාරයේ කුලිය රු. 80 000 ක් කලින් ගෙවූ කුලී ගිණුමෙහි ඇතුළත් කර ඇත.

(iii) 2019 මාර්තු මාසය සඳහා රු. 5 000 ක විදුලි බිල 2019.03.31 දිනට ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොතිබුණි.

(iv) 2019.03.30 දින පිරිවැය රු. 80 000 ක ණයට මිල දී ගත් භාණ්ඩ, ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

(v) 2019.03.30 දින පිරිවැය රු. 200 000 ක භාණ්ඩ රු. 400 000 ක අත්පිට මුදලට විකිණීම ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි. කෙසේ වුව ද මේ සඳහා ලද චෙක්පත 2019.04.01 දින බැංකුවෙහි තැන්පත් කර තිබුණි.

(vi) පිරිවැය රු. 40 000 ක තොග අයිතම වර්ෂය තුළ දී විනාශ වූ අතර එම අයිතම විකිණිය හැකි තත්ත්වයක නොතිබුණි. කෙසේ වුව ද මෙම අයිතම පිරිවැයට 2019.03.31 දිනට තොගයේ ඇතුළත්ව තිබුණු අතර ඒවාට උපලබ්ධි අගයක් නොවී ය.

(vii) අයිතම 40 ක් මිලට ගැනීම සඳහා ගනුදෙනුකරුවකු විසින් ඇණවුමක් ඉදිරිපත් කරන ලදී. එම භාණ්ඩවල විකුණුම් මිල රු. 240 000 ක් වූ අතර මෙම මුදල වර්ෂය තුළ දී ලැබී ඇත. මෙම මුදල, ලද අත්තිකාරම් ගිණුමේ සටහන් කර ඇත. කෙසේ වුව ද මෙම අයිතමවලින් අඩක් පමණක් 2019.03.31 දින වන විට ගනුදෙනුකරුට බෙදාහැර ඇති අතර ඒවායේ පිරිවැය රු. 80 000 කි. තවද මෙම බෙදාහැරීමට අදාළ කිසිදු සටහනක් තබා නොමැත. ඉතිරි භාණ්ඩ බෙදාහැරිය යුත්තේ ඉදිරි වර්ෂය තුළ දී ය.

[පස්වැනි පිටුව බලන්න.

(viii) 2019.03.28 දින ණයගැතියෙකුගෙන් ලද රු. 20 000 ක චෙක්පතක් බැංකුව විසින් 2019.03.31 දින අගරු කර ඇති බව 2019.04.03 ලද බැංකු ප්‍රකාශනයෙන් හෙළිදරව් විය.

(ix) තවද 2019.03.31 දින ණයගැතියෙකු විසින් රු. 50 000 ක චෙක්පතක් බැංකුවේ සෘජුව තැන්පත් කර ඇති බව බැංකු ප්‍රකාශනය තුළින් අනාවරණය විය. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මෙම මුදල අයකර ගත නොහැකි වටිනාකමක් ලෙස කපා හැර තිබුණි.

(x) ව්‍යාපාරය විසින් ගෙවූ අයිතිකරුගේ දරුවකුගේ විභාග ගාස්තු රු. 2 000 ක් බැංකු ප්‍රකාශනයෙන් හෙළිදරව් විය.

**අවශ්‍යවන්නේ:**

(1) අංක (i) සිට (x) දක්වා අයිතමවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (–) ද යන්න සඳහන් කරන්න. (පිළිතුරු සැපයීමේ දී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

**(රු.'000)**

| | දේපළ, පිරියත සහ උපකරණ | තොග | | කලින් ගෙවූ කුලී | මුදල් | වෙළෙඳ ගෙවිය යුතු දෑ | උපචිත වියදම් | ලද අත්තිකාරම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ශේෂය | 4 500 | 600 | 820 | 480 | 610 | 100 | 90 | 240 | 6 580 |
| (i) | | | | | | | | | |
| (ii) | | | | | | | | | |
| | | | | | | | | | |
| සංශෝධිත ශේෂය | | | | | | | | | |

(2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ලාභය නිවැරදි කිරීම දක්වන ප්‍රකාශනයක්

(3) ඉහත අයිතම අංක (ii), (iii), (iv), (ix) සහ (x) නිවැරදි කිරීම/සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් (සංලක්ෂය සහිතව)

***(මුළු ලකුණු 40 යි)***

**4.** **(අ)** මදාරා වෙළෙන්දෝ එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති ආයතනයකි. පහත ශේෂ 2018.12.31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදී.

| | **රු.** |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ ............................ | 120 000 |
| මුදල් .................................................. | 30 000 |
| වෙළෙඳ ණයහිමියෝ ............................. | 70 000 |
| ගෙවිය යුතු VAT .................................. | 30 000 |

පහත ගනුදෙනු 2019.01.31 දිනෙන් අවසන් මාසයේ දී මෙම ආයතනයේ සිදු වී ඇත.

| **දිනය** | **ගනුදෙනුව** |
|---|---|
| 2019.01.05 | සීමිත අමල් (පුද්ගලික) සමාගමෙන් රු. 230 000 ක භාණ්ඩ ණයට මිලට ගන්නා ලදී. (මෙම මිල දී ගැනීම තුළ VAT රු. 30 000 ක් ඇතුළත් වේ.) |
| 2019.01.10 | රු. 150 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 207 000 කට අත්පිට මුදලට විකුණන ලදී. (මෙම විකුණුම තුළ VAT රු. 27 000 ක් ඇතුළත් වේ.) |
| 2019.01.12 | 2018.12.31 දිනට ණයගැති ශේෂය සම්පූර්ණයෙන් පියවන පරිදි වට්ටමකට යටත්ව රු. 110 000 ක් ලැබුණි. |
| 2019.01.15 | 2018.12.31 දිනට වෙළෙඳ ණයහිමියන්ට ගෙවිය යුතු මුළු මුදල පියවන ලදී. |
| 2019.01.16 | සීමිත අමල් (පුද්ගලික) සමාගමට ගෙවිය යුතු මුදල පියවන ලද අතර රු. 5 000 ක වට්ටමක් ලැබුණි. |
| 2019.01.18 | රු. 360 000 ක ලකුණු කළ මිලක් සහිත භාණ්ඩ රු. 345 000 කට නාදන් වෙළෙඳුන්ගෙන් ණයට මිල දී ගන්නා ලදී. (මෙම මිල දී ගැනීම තුළ VAT රු. 45 000 ක් ඇතුළත් වේ.) |

*[හයවැනි පිටුව බලන්න.*

| | |
|---|---|
| 2019.01.20 | රු. 350 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 460 000 කට සීමිත ජයමාල් පොදු සමාගමට ණයට විකුණන ලදී. (මෙම විකුණුම තුළ VAT රු. 60 000 ක් ඇතුළත් වේ.) |
| 2019.01.28 | රු. 60 000 ක කාර්යාල වියදම් ගෙවන ලදී. |
| 2019.01.30 | සීමිත ජයමාල් පොදු සමාගමෙන් ලැබිය යුතු මුදලෙන් කොටසක් පියවීම සඳහා රු. 360 000 ක් ලැබුණි. |

වියදම් සඳහා VAT නොමැති බව උපකල්පනය කරන්න.

**අවශ්‍යවන්නේ:**

(1) 2019.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ව්‍යාපාරයේ පහත මූලික සටහන් පොත්:
 (i) මුදල් ලැබීම් ජර්නලය
 (ii) මුදල් ගෙවීම් ජර්නලය
 (iii) ගැනුම් ජර්නලය

(2) 2019.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත ගිණුම්:
 (i) වෙළෙඳ ණයගැති පාලන ගිණුම
 (ii) වෙළෙඳ ණයහිමි පාලන ගිණුම
 (iii) VAT පාලන ගිණුම
 (iv) මුදල් ගිණුම

**(ලකුණු 20 යි)**

(ආ) 2019 මාර්තු මාසය සඳහා පහත තොරතුරු සුහද ක්‍රීඩා සමාජය හා බැඳේ. මෙම ක්‍රීඩා සමාජය ලාභ අරමුණකින් තොරව පවත්වාගෙන යනු ලබයි.

| විස්තරය | 2019.03.31 දිනට (රු.'000) | 2019.02.28 දිනට (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ (ධාරණ වටිනාකමට) | 1 000 | 800 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 60 | 40 |
| කලින් ලද සාමාජික මුදල් | ? | 100 |
| බැංකුවේ ඇති මුදල් | ? | 80 |
| සමුච්චිත අරමුදල | ? | 820 |

පහත ගනුදෙනු 2019.03.31 දිනෙන් අවසන් මාසය තුළ ක්‍රීඩා සමාජයෙහි සිදු විය.

(i) සාමාජික මුදල් රු. 300 000 ක් ලැබුණි. (මාසය මුල ලැබිය යුතු සාමාජික මුදල් රු. 40 000 ක් සහ 2019 අප්‍රේල් මාසය සඳහා ලද රු. 70 000 ක් ද මෙහි ඇතුළත් වේ.)

(ii) මාසය තුළ නව සාමාජිකයින් 14 ක් ක්‍රීඩා සමාජයට ඇතුළත් වූ අතර එක් අයකු රු. 10 000 බැගින් ඇතුළත් වීමේ ගාස්තු ගෙවා ඇත.

(iii) 2019.03.01 දින රු. 300 000 ක පිරිවැයකට කාර්යාල උපකරණ අත්පිට මුදලට මිල දී ගන්නා ලදී.

(iv) රු. 180 000 ක වැටුප් ගෙවන ලදී. (2019.03.31 දිනට ගෙවිය යුතු වැටුප් රු. 30 000 කි).

ක්‍රීඩා සමාජය එහි සියලුම මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලබයි. ක්‍රීඩා සමාජයේ 2019.02.28 දින මුදල් ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ විය. කෙසේ වුව ද 2019.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය, එදිනට මුදල් ගිණුමේ ශේෂය සමග එකඟ නොවී ය. බැංකු ප්‍රකාශනයට අනුව 2019 මාර්තු මාසය තුළ දී පහත ගනුදෙනු සිදු වී ඇත.

| | රු. |
|---|---|
| උපලබ්ධි වූ චෙක්පත් ............................................... | 400 000 |
| ගෙවීමට ඉදිරිපත් කළ චෙක්පත් ................................... | 350 000 |
| බැංකුවෙහි සෘජුව තැන්පත් කරන ලද පරිත්‍යාගය............ | 20 000 |
| කාර්යාල කුලිය සඳහා ස්ථාවර නියෝග ගෙවීම .............. | 10 000 |

පරිත්‍යාගය සඳහා වූ සෘජු තැන්පතුව සහ කාර්යාල කුලිය සඳහා ස්ථාවර නියෝග ගෙවීම බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසුව මුදල් ගිණුමෙහි සටහන් කර ඇත. පරිත්‍යාග සහ ඇතුළත් වීමේ ගාස්තු ඒවා ලද මාසය තුළ දී ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

**අවශ්‍යවන්නේ:**

(1) 2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් ගිණුම

(2) 2019 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය

[හත්වැනි පිටුව බලන්න.

(3) 2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය
(4) 2019.03.31 දිනට කලින් ලද සාමාජික මුදල් සහ සමුච්චිත අරමුදල

**(ලකුණු 20 යි)**
**(මුළු ලකුණු 40 යි)**

5. (අ) නදී සහ ගංගා 2018.04.01 දින සුපිරි වෙළෙඳසැලක් පවත්වාගෙන යාම සඳහා හවුල් ව්‍යාපාර ගිවිසුමකට එළඹෙන ලදී. එදිනම ඔවුන් පහත වත්කම් ඔවුන්ගේ ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට ගෙන එන ලදී:

| | නදී (රු.'000) | ගංගා (රු.'000) |
|---|---|---|
| ඉඩම් | 1 500 | |
| ගොඩනැගිලි | 1 000 | 1 000 |
| කාර්යාල උපකරණ | | 1 000 |
| මුදල් | 500 | |

හවුල් ගිවිසුමෙහි කොන්දේසි පහත පරිදි වේ:

- හවුල්කරුවන් අතර ලාභාලාභ ඔවුන් විසින් 2018.04.01 දින හඳුන්වා දුන් ප්‍රාග්ධනයේ අනුපාතයට බෙදාගනු ලබයි.
- සෑම හවුල්කරුවකුම හවුල් ව්‍යාපාරය ආරම්භ කරන ලද දින සිට පළමු මාස හය සඳහා රු. 50 000 බැගින් වූ මාසික වේතනයකට සහ ඉන් පසුව රු. 60 000 ක් බැගින් වූ මාසික වේතනයකට හිමිකම් ලබයි.
- හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයන ලද ණය සඳහා වාර්ෂිකව 8% ක පොලියකට හිමිකම් ලබයි.
- ව්‍යාපාරය තුළ කීර්තිනාම ගිණුමක් පවත්වා නොගන්නා අතර හවුල් ව්‍යාපාරයෙහි කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැළපිය යුතු වේ.

2019.03.31 දිනට ව්‍යාපාරයෙහි සාරාංශගත ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| විකුණුම් | | 5 000 |
| විකුණුම් පිරිවැය | 1 800 | |
| 2019.03.31 දිනට තොගය | 400 | |
| මෙහෙයුම් වියදම් | 1 200 | |
| දේපළ, පිරියත සහ උපකරණ | 4 500 | |
| ක්ෂය | 200 | |
| සමුච්චිත ක්ෂය | | 200 |
| 2019.01.01 දින නදී විසින් ලබා දුන් ණය | | 1 500 |
| ගෙවූ රක්ෂණ වාරික | 500 | |
| හවුල්කරුවන්ට ගෙවූ වේතන: | | |
| නදී | 300 | |
| ගංගා | 500 | |
| ප්‍රාග්ධන ගිණුම්: | | |
| නදී | | 3 000 |
| ගංගා | | 2 000 |
| සාගර ලබා දුන් මුදල | | 1 500 |
| මුදල් | 3 800 | |
| | **13 200** | **13 200** |

**අතිරේක තොරතුරු:**

(i) වර්ෂය තුළ දී නදී විසින් රු. 80 000 ක පිරිවැය වූ භාණ්ඩ ව්‍යාපාරයෙන් ලබාගෙන ඇත. මෙය ව්‍යාපාරයේ ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(ii) වර්ෂය තුළ දී ගංගා විසින් සිය පෞද්ගලික මුදල් භාවිත කර මිල දී ගත් පිරිවැය රු. 400 000 ක භාණ්ඩ හවුල් ව්‍යාපාරයට ලබා දී ඇත. මෙම භාණ්ඩවල පිරිවැය ගංගා විසින් ව්‍යාපාරයට කරන ලද ප්‍රාග්ධන දායකත්වයක් ලෙස සැලකීමට තීරණය කරන ලදී. නමුත් මේ සම්බන්ධයෙන් පොත්වල කිසිදු සටහනක් කර නොමැත. කෙසේ වුව ද මෙම සියලු භාණ්ඩ වර්ෂය තුළ දී විකුණා ඇති අතර විකුණුම් ගිණුමෙහි සටහන් කර ඇත.

(iii) නදී විසින් ලබා දුන් ණය සඳහා පොලිය ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(iv) ගංගාගේ පෞද්ගලික ආදායම් බද්ද වූ රු. 65 000 ක් ව්‍යාපාරය විසින් ගෙවා ඇත. මෙය ව්‍යාපාරයෙහි මෙහෙයුම් වියදමක් ලෙස සටහන් කර ඇත.

(v) ව්‍යාපාරය විසින් ගෙවූ රක්ෂණ වාරිකවල සංයුතිය පහත පරිදි වේ:
- ⁕ සුපිරි වෙළෙඳසැල සඳහා ගිනි රක්ෂණය - රු. 300 000
- ⁕ නදීගේ ජීවිත රක්ෂණය - රු. 200 000

(vi) 2019.03.31 දින සාගර හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට බැඳුණි. ඔහු රු. 1 500 000 ක් ප්‍රාග්ධනය ලෙස හවුල් ව්‍යාපාරයට යෙදවූ අතර එය වෙනම ගිණුමක සටහන් කර ඇත. නදී, ගංගා සහ සාගර අතර නව ලාභාලාභ අනුපාතය පිළිවෙළින් 3 : 2 : 1 ක් වේ. මෙදිනට ව්‍යාපාරයෙහි කීර්තිනාමය රු. 600 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කෙසේ වුව ද මෙය ගිණුම්ගත කර නොමැත.

**අවශ්‍යවන්නේ:**

(1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද සහිතව)

(2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

**(ලකුණු 20 යි)**

**(ආ)** පාසලක් එහි ගුරුවරුන්ගේ වාර්ෂික චාරිකාව සැලසුම් කරමින් සිටී. පාසලෙහි ගිණුම්කරණ ගුරුවරයා විසින් චාරිකාව සඳහා පහත තොරතුරු ඇස්තමේන්තු කර ඇත.

| | | |
|---|---|---|
| ගුරුවරයකුගෙන් අය කරන ගාස්තුව | රු. | 1 500 |
| ආසන 40 ක ධාරිතාවයක් සහිත එක් බසයක කුලිය | රු. | 40 000 |
| එක් බසයක රියදුරු සහ සහායකට දීමනා | රු. | 2 000 |
| එක් ගුරුවරයකු සඳහා සංග්‍රහ වියදම් | | ? |
| මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව | | 100 |
| චාරිකාව සඳහා අපේක්ෂිත උපරිම ගුරුවරු සංඛ්‍යාව | | 120 |

එක් බසයක ගමන් කරන ගුරුවරු සංඛ්‍යාව එහි ආසන ධාරිතාවයට සීමා කෙරේ.

**අවශ්‍යවන්නේ:**

(1) චාරිකාවේ මුළු ස්ථාවර පිරිවැය

(2) ගුරුවරයකුගේ දායකය

(3) ගුරුවරයකු සඳහා සංග්‍රහ වියදම

(4) චාරිකාවෙහි ආරක්ෂිත ආන්තිකය (සංඛ්‍යාව සහ රුපියල් වටිනාකම)

(5) අපේක්ෂිත උපරිම ගුරුවරු සංඛ්‍යාව සහභාගි වන්නේ නම් චාරිකාවෙන් ලැබෙන අතිරික්තය

(6) ගුරුවරුන් 90 ක් පමණක් සහභාගි වන්නේ නම් මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා ගුරුවරයකුගෙන් අය කළ යුතු ගාස්තුව

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

[නවවැනි පිටුව බලන්න.

6. (අ) පහත තොරතුරු 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අනුර පොදු සමාගමට අදාළ වේ.

| | රු.'000 |
|---|---|
| විකුණුම් ආදායම ................................ | 9 000 |
| වර්ෂය සඳහා ලාභය ........................... | 600 |
| ආදායම් බදු වියදම ........................... | 40 |
| පොලී වියදම් ...................................... | 80 |

තවද 2019.03.31 දිනට පහත ශේෂ ද පැවතුණි.

| | රු.'000 |
|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (නිකුත් කළ මුළු කොටස් සංඛ්‍යාව 150 000) ...................... | 4 200 |
| මුළු වත්කම් ........................................................................................................ | 8 400 |

2018.04.01 දිනට මුළු වත්කම් සහ රඳවාගත් ඉපැයුම් පිළිවෙළින් රු. 6 600 000 ක් සහ රු. 1 200 000 ක් විය. 2019.03.31 දිනට සමාගමේ වගකීම්, දිගුකාලීන ණයවලින් පමණක් සමන්විත වූ බව උපකල්පනය කරන්න.

**අවශ්‍යවන්නේ:**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත **අනුපාත** ගණනය කිරීම:

(1) ශුද්ධ ලාභ
(2) පොලී ආවරණ
(3) හිමිකම් මත ප්‍රතිලාභ
(4) කොටසක ඉපැයුම්
(5) ණය හිමිකම්

**(ලකුණු 10 යි)**

(ආ) සීමිත කැළුම් පොදු සමාගම පැරණි යන්ත්‍රයක් වෙනුවට නව යන්ත්‍රයක් අත්පත් කර ගැනීමට සලකා බලමින් සිටියි. සමාගමේ කළමනාකරණ ගණකාධිවරයා විසින් නව යන්ත්‍රය සම්බන්ධයෙන් පහත ඇස්තමේන්තුගත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| ගැනුම් මිල | රු. 1 200 000 |
| ඵලදායී ජීව කාලය | වසර 5 |
| සුන්බුන් අගය | රු. 200 000 |
| ස්ථාපනය කිරීමේ ගාස්තුව | රු. 75 000 |
| වැඩ බිම සකස් කිරීමේ වියදම් | රු. 125 000 |
| වාර්ෂික නඩත්තු පිරිවැය | රු. 100 000 |

**අතිරේක තොරතුරු:**

(i) නව යන්ත්‍රයේ අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු. 300 000 ක් වන අතර මෙම ව්‍යාපෘතිය අවසානයේ දී එය නැවත ලබා ගත හැකි ය.
(ii) නව යන්ත්‍රය නිසා මෙහෙයුම් පිරිවැයේ අපේක්ෂිත වාර්ෂික ඉතිරිය රු. 500 000 කි.
(iii) නව යන්ත්‍රය මිල දී ගතහොත් පැරණි යන්ත්‍රය ව්‍යාපෘතිය ආරම්භයේ දී රු. 400 000 කට විකිණිය හැකි යැයි ඇස්තමේන්තු කර ඇත.
(iv) මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 12% කි.
(v) 12% වට්ටම් සාධක:

| වසර | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.89 | 0.80 | 0.71 | 0.64 | 0.57 |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියෙහි මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් ලේඛනය සහ එහි ශුද්ධ වර්තමාන අගය
(2) ශුද්ධ වර්තමාන අගය පදනම්ව නව යන්ත්‍රය මිල දී ගත යුතු ද යන නිර්දේශය

**(ලකුණු 10 යි)**

[දහවැනි පිටුව බලන්න.

(ඉ) සීමිත නිහාල් පොදු සමාගමේ වත්කම් සහ වගකීම් ශේෂ කිහිපයක් පහත පරිදි විය.

| විස්තරය | 2019.03.31 දිනට (රු.) | 2018.03.31 දිනට (රු.) |
|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 250 000 | 180 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 110 000 | 140 000 |
| ගෙවිය යුතු මෙහෙයුම් වියදම් | 15 000 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | ? | 120 000 |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී මෙම සමාගමේ පහත ගනුදෙනු සිදු විය:

(i) වර්ෂය සඳහා මුළු විකුණුම් සහ ගැනුම් පිළිවෙළින් රු. 1 200 000 ක් සහ රු. 550 000 ක් විය. (සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.)

(ii) වර්ෂය තුළ වෙළෙඳ ණයගැතියන්ට ලබාදුන් මුදල් වට්ටම් රු. 30 000 ක් විය.

(iii) රු. 35 000 ක ක්ෂයවීම් ද ඇතුළත්ව වර්ෂය සඳහා මුළු මෙහෙයුම් වියදම් රු. 95 000 ක් විය.

(iv) වර්ෂය සඳහා පොලී සහ ආදායම් බදු වියදම් පිළිවෙළින් රු. 25 000 ක් සහ රු. 65 000 ක් විය. වර්ෂය තුළ ගෙවූ පොලී සහ ගෙවූ ආදායම් බදු පිළිවෙළින් රු. 20 000 ක් සහ රු. 75 000 ක් විය.

(v) වර්ෂය තුළ ගෙවන ලද මුළු අතුරු ලාභාංශ රු. 60 000 ක් විය.

(vi) වර්ෂය තුළ සමාගම එකක් රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 30 000 ක් නිකුත් කරන ලදී. මෙම කොටස් නිකුත් කිරීම් තුළ රු. 200 000 ක සංචිත ප්‍රාග්ධනීකරණයක් ද ඇතුළත් විය. නිකුත් කළ ඉතිරි කොටස් සඳහා ලැබිය යුතු මුදල වසර තුළ ලැබී ඇත.

(vii) වර්ෂය තුළ දිගුකාලීන ණයවලින් කොටසක් පියවීම සඳහා රු. 220 000 ක් සමාගම විසින් ගෙවා ඇත.

(viii) 2018.04.01 දින සමාගම විසින් නව මෝටර් රථයක් අත්පිට මුදලට මිල දී ගෙන ඇත. එදිනම රු. 80 000 ක ලාභයක් සහිතව කාර්යාල උපකරණයක් රු. 250 000 කට අත්පිට මුදලට විකුණා ඇත. මෙම ගනුදෙනු හා ක්ෂයවීම්වල ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම රු. 205 000 කින් ඉහළ ගොස් ඇත.

**අවශ්‍යවන්නේ:**

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (මෙහෙයුම් මුදල් ප්‍රවාහ හඳුනාගැනීම සඳහා සෘජු ක්‍රමය භාවිත කරන්න.)

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

***

නව නිර්දේශය

ප්‍රශ්න අංක 01

(1)

සීමිත සනුග පොදු සමාගම
2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (01)
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | සටහන් | (රු'000) | |
|---|---|---|---|
| විකුණුම් | | 88 000 | |
| විකුණුම් පිරිවැය | | (45 000) | |
| දළ ලාභය | | 43 000 | |
| වෙනත් ආදායම් | | - | |
| බෙදාහැරීමේ පිරිවැය | | (4 962) | (04) |
| පරිපාලන වියදම් | | (12 625) | (03) |
| වෙනත් වියදම් | | (900) | (02) |
| මූල්‍ය පිරිවැය | | (1 096) | (01) |
| බදු පෙර ලාභය | 01 | 23 417 | |
| ආදායම් බදු | 02 | (1 795) | (02) |
| කාලච්ඡේදයේ ලාභය | (01) | 21 622 | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය | | 2 500 | (01) |
| මුළු විස්තීරණ ආදායම | (01) | 24 122 | |

සටහන 01 - බදු පෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම් ද අඩුකිරීමෙන් පසුවය :

| | (රු'000) |
|---|---|
| අධ්‍යක්ෂ ගාස්තු | 900 |
| විගණන ගාස්තු | 250 |
| වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | 540 |
| වන්දි සඳහා ප්‍රතිපාදන | 600 |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය | 7 875 |
| භාවිත අයිතිය ඇති වත්කම් ක්ෂය | 1 192 |
| කල්බදු පොලී | 346 |

ඕනෑම අයිතම දෙකකට 01 බැගින් ලකුණු (02)

(ලකුණු 18)

සටහන 02 - ආදායම් බදු

| | (රු'000) | |
|---|---|---|
| ප්‍රවර්ථන වර්ෂය සඳහා වෙන්කිරීම | 1 920 | 01 |
| පසුගිය වර්ෂය සඳහා අධි වෙන් කිරීම | (125) | 01 |
| | 1 795 | |

පෙරවැඩ රු.'000

| | | | | | |
|---|---|---|---|---|---|
| **බෙදාහැරීමේ පිරිවැය** | | | **පරිපාලන වියදම්** | | |
| බෙදා හැරීමේ පිරිවැය | 5 200 | | පරිපාලන වියදම් | 4 500 | |
| වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | 540 | 01 | ගොඩනැගිලි ක්ෂය | 4 750 | 01 |
| වගකීම් සහතික සඳහා වියදම | (470) | 01 | කාර්යාල උපකරණ ක්ෂය | 3 125 | 01 |
| භාවිත අයිතිය සහිත මෝටර් රථ ක්ෂය | 1 192 | 01 | විගණන ගාස්තු | 250 | 01 |
| අතුරු ලාභාංශ | (1 500) | 01 | | 12 625 | |
| | 4 962 | | | | |
| **වෙනත් වියදම්** | | | **මූල්‍ය පිරිවැය** | | |
| වෙනත් වියදම් | 1 800 | | මූල්‍ය වියදම් | 750 | |
| වන්දි සඳහා ප්‍රතිපාදන | 600 | 01 | කල්බදු පොලී | 346 | 01 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අලාභය හිලව් කිරීම | (1 500) | 01 | | 1 096 | |
| | 900 | | | | |

(2) **සීමිත සනුග පොදු සමාගම**

**2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය (රු.'000)**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් | ප්‍රත්‍යාගණන සංචිතය | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|
| 2018.04.01 දිනට ශේෂය | 45 500 | - | 6 395 | 51 895 |
| මුළු විස්තීරණ ආදායම | | (01) 2 500 | 21 622 | 24 122 |
| ලාභාංශ | | | (1 500) (01) | (1 500) |
| 2019.03.31 දිනට ශේෂය | 45 500 | 2 500 | 26 517 | 74 517 |

(ලකුණු 02)

(3)

**සීමිත සනුග පොදු සමාගම**
**2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (01)**

| | සටහන් | රු'000 | |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 03 | (01) 71 125 | |
| භාවිත අයිතිය සහිත වත්කම් | 04 | (01) 4 768 | |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 4 200 | (01) |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | 17 300 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | | 750 | |
| **මුළු වත්කම්** | | 98 143 | |
| **හිමිකම්** | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් | | 45 500 | (01) |
| **සංචිත** | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 2 500 | |
| රඳවාගත් ඉපැයුම් | | (01) 26 517 | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| කල්බදු වගකීම | | 1 562 | (01) |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 19 000 | |
| කල්බදු වගකීම | | 994 | (01) |
| ගෙවිය යුතු ආදායම් බදු | | 570 | (01) |
| වෙනත් ගෙවිය යුතු දෑ | 05 | 1 500 | (03) |
| **මුළු හිමිකම සහ වගකීම්** | | 98 143 | |

සටහන 03 - දේපල, පිරියත සහ උපකරණ

රු'000

| | ඉඩම් | ගොඩනැගිලි | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|---|
| පිරිවැය/අගය | | | | |
| 2018.04.01 දිනට ශේෂ | 20 000 | 45 000 | 10 000 | 75 000 |
| එකතු කිරීම් | 10 000 (01) | | 5 000 (01) | 15 000 |
| ප්‍රත්‍යාගණනය | | 4 000 (01) | | 4 000 |
| ප්‍රත්‍යාගණනය මත ක්ෂය මාරු කිරීම | | (11 000) (01) | | (11 000) |
| 2019.03.31 දිනට ශේෂ | 30 000 | 38 000 | 15 000 | 83 000 |
| සමුච්චිත ක්ෂය | | | | |
| 2018.04.01 දිනට ශේෂ | | 11 000 | 4 000 | 15 000 |
| ප්‍රත්‍යාගණනය මත ක්ෂය ඉවත් කිරීම | | (11 000) (01) | | (11 000) |
| කාලච්ඡේදයේ ක්ෂය | | (01) 4 750 | 3 125 | 7 875 |
| 2019.03.31 දිනට ශේෂ | - | 4 750 | 7 125 | 11 875 |
| 2019.03.31 දිනට ධාරණ වටිනාකම | 30 000 | 33 250 | 7 875 | 71 125 |

සටහන 04 - භාවිත අයිතිය සහිත වත්කම් රු'000

| | |
|---|---|
| මූලික මිනුම් කිරීමේදී පිරිවැය | 5 960 (01) |
| සමුච්චිත ක්ෂය | (1 192) |
| 2019.03.31 දිනට ධාරණ වටිනාකම | 4 768 |

සටහන 05 - වෙනත් ගෙවිය යුතු දෑ රු'000

| | |
|---|---|
| විගණන ගාස්තු | 250 [01] |
| වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | 650 [01] |
| වන්දි සඳහා ප්‍රතිපාදන | 600 [01] |
| | 1 500 |

සටහන 06 - සාමාන්‍ය කොටස් සඳහා රු.1 000 000ක අවසාන ලාභාංශයක් යෝජනා කර ඇත. (01)

(ලකුණු 20)
(මුළු ලකුණු 40)

ප්‍රශ්න අංක 01

| 1 | 2 | 3 | එකතුව |
|---|---|---|---|
| 18 | 02 | 20 | 40 |

ප්‍රශ්න අංක 02

(අ) (1) උපරිම තොග මට්ටම - A අමුද්‍රව්‍ය = කි.ග්‍රෑ. 32 000 (03)

අවම තොග මට්ටම - A අමුද්‍රව්‍ය = කි.ග්‍රෑ. 6 000 (02)

පෙරවැඩ

උපරිම තොග මට්ටම = යළි ඇනවුම් මට්ටම − (අවම පරිභෝජනය × අවම පොරොත්තු කාලය) + යළි ඇනවුම් ප්‍රමාණය

= 18 000 [01] − (3 000 × 2) [01] + 20 000 [01]

= 32 000

අවම තොග මට්ටම = යළි ඇනවුම් මට්ටම − (සාමාන්‍ය පරිභෝජනය × සාමාන්‍ය පොරොත්තු කාලය)

= 1 8000 [01] − (4 000 × 3) [01]

= 6 000

(ලකුණු 05)

(2) යළි ඇනවුම් මට්ටම - B අමුද්‍රව්‍ය = කි.ග්‍රෑ. 12 500 (02)

යළි ඇනවුම් ප්‍රමාණය - B අමුද්‍රව්‍ය = කි.ග්‍රෑ. 11 000 (03)

පෙරවැඩ

යළි ඇනවුම් මට්ටම = උපරිම පරිභෝජනය × උපරිම පොරොත්තු කාලය

= 2 500 [01] × 5 [01]

= 12 500

උපරිම තොග මට්ටම = යළි ඇනවුම් මට්ටම − (අවම පරිභෝජනය × අවම පොරොත්තු කාලය) + යළි ඇනවුම් ප්‍රමාණය

19 000 [01] = [01] 12 500 − (1 500 × 3) [01] + $x$

$x$ = 11 000

(ලකුණු 05)

(3) සාමාන්‍ය තොග මට්ටම - A අමුද්‍රව්‍ය = කි.ග්‍රෑ. 19 000/කි.ග්‍රෑ. 16 000 (03)

සාමාන්‍ය තොග මට්ටම - B අමුද්‍රව්‍ය = කි.ග්‍රෑ. 12 000/කි.ග්‍රෑ. 10 500 (03)

| පෙරවැඩ | විකල්ප |
|---|---|
| සාමාන්‍ය තොග මට්ටම = $\frac{\text{උපරිම තොග මට්ටම} + \text{අවම තොග මට්ටම}}{2}$ | සාමාන්‍ය තොග මට්ටම = අවම තොග මට්ටම + $\frac{\text{යලි ඇනවුම් ප්‍රමාණය}}{2}$ |
| A අමුද්‍රව්‍ය = $\frac{\boxed{01}\ 32\,000 + \boxed{01}\ 6000}{2\ \boxed{01}}$ | = $\boxed{01}\ 6000 + \frac{20\,000\ \boxed{01}}{2\ \boxed{01}}$ |
| = 19 000 | = 16 000 |
| සාමාන්‍ය තොග මට්ටම = $\frac{\text{උපරිම තොග මට්ටම} + \text{අවම තොග මට්ටම}}{2}$ | සාමාන්‍ය තොග මට්ටම = අවම තොග මට්ටම + $\frac{\text{යලි ඇනවුම් ප්‍රමාණය}}{2}$ |
| B අමුද්‍රව්‍ය = $\frac{19\,000\ \boxed{01} + 5\,000\ \boxed{01}}{2\ \boxed{01}}$ | = $5\,000\ \boxed{01} + \frac{\boxed{01}\ 11\,000}{2\ \boxed{01}}$ |
| = 12 000 | = 10 500 |

(ලකුණු 06)

(ආ) (1) පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

| අයිතමය | විභාජන පදනම | එකතුව | නිෂ්පාදන අංශ | | සේවා අංශය |
|---|---|---|---|---|---|
| | | | එකලස් | නිමැවුම් | ගබඩාව |
| සුපරීක්ෂක වැටුප් | සෘජු | 1 690 | 530 | 730 | 430 (01) |
| කුලිය | භූමි ප්‍රමාණය (3 : 2 : 1) (01) | 360 | 180 | 120 | 60 (01) |
| විදුලිය | කිලෝ වොට් පැය (2 : 3 : 1) (01) | 180 | 60 | 90 | 30 (01) |
| ආරක්ෂක ගාස්තු | ආරක්ෂක සේවක සංඛ්‍යාව (5 : 3 : 4) (01) | 240 | 100 | 60 | 80 (01) |
| යන්ත්‍ර ක්ෂය | යන්ත්‍ර පිරිවැය/සෘජු | 250 | 90 (01) | 160 (01) | - |
| | | 2 720 | 960 | 1 160 | 600 |
| ගබඩා පොදු කාර්ය පිරිවැය නැවත විභජනය | අමුද්‍රව්‍ය අධියාචනා පත් සංඛ්‍යාව (3 : 2) | - | (01) 360 | (01) 240 | (600) |
| මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | | - | (01) 1 320 | 1 400 | - |

(ලකුණු 12)

(2) පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

එකලස් දෙපාර්තමේන්තුව - යන්ත්‍ර පැයකට රු. 110 (02)

නිමැවුම් දෙපාර්තමේන්තුව - ශ්‍රම පැයකට රු. 100 (02)

(ලකුණු 04)

පෙරවැඩ

එකලස් දෙපාර්තමේන්තුව $\frac{1\ 320\ 000 \ [01]}{12\ 000 \ [01]}$ = රු. 110

නිමැවුම් දෙපාර්තමේන්තුව $\frac{1\ 400\ 000 \ [01]}{14\ 000 \ [01]}$ = රු. 100

(3) ABC භාණ්ඩය සඳහා ඒකක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය = රු. 520 (02)

ඒකකයක විකුණුම් මිල = රු. 1080 (02)

**පෙරවැඩ**

| | | | |
|---|---|---|---|
| එකලස් | 01 { 110 × 2 } 01 | = | 220 |
| නිමැවුම් | 100 × 3 | = | 300 |
| | | | 520 |

| | | |
|---|---|---|
| ප්‍රාථමික පිරිවැය | = | 380 [01] |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | = | 520 |
| නිෂ්පාදන පිරිවැය | = | 900 |
| විකුණුම් මිල | = | $900 \times \frac{120}{100}$ [01] = 1080 |

(ලකුණු 04)

(4) PQR භාණ්ඩය සඳහා ඒකක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය = රු. 640 (02)

ප්‍රාථමික පිරිවැය = රු. 360 (02)

**පෙරවැඩ**

| | | | |
|---|---|---|---|
| එකලස් | 01 { 110 × 4 } 01 | = | 440 |
| නිමැවුම් | 100 × 2 | = | 200 |
| | | | 640 |

| | | |
|---|---|---|
| මුළු නිෂ්පාදන පිරිවැය | $= \frac{1200}{120} \times 100 =$ | 1000 [01] |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | = | [01] (640) |
| ප්‍රාථමික පිරිවැය | = | 360 |

(ලකුණු 04)

(මුළු ලකුණු 40)

ප්‍රශ්න අංක 02

| | 1 | 2 | 3 | 4 | එකතුව |
|---|---|---|---|---|---|
| (අ) | 05 | 05 | 06 | - | 16 |
| (ආ) | 12 | 04 | 04 | 04 | 24 |
| | | | | | 40 |

ප්‍රශ්න අංක 03

(1)

| අයිතම අංක | වත්කම් | | | | | වගකීම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පිරියත සහ උපකරණ | තොග | වෙළෙඳ ලැබිය යුතු දෑ | කලින් ගෙවූ කුලී | මුදල් | වෙළෙඳ ගෙවිය යුතු දෑ | උපචිත වියදම් | ලද අත්තිකාරම් | හිමිකම් |
| ශේෂ | 4500 | 600 | 820 | 480 | 610 | 100 | 90 | 240 | 6580 |
| (i) | – 500 | | | | | | | | – 500 (01) |
| (ii) | | | | – 80 | | | | | – 80 (01) |
| (iii) | | | | | | | + 5 | | – 5 (01) |
| (iv) | | + 80 | | | | + 80 | | | (01) |
| (v) | | – 200 | | | + 400 | | | | + 200 (03) |
| (vi) | | – 40 | | | | | | | – 40 (02) |
| (vii) | | – 80 | | | | | | – 120 | + 40 (03) |
| (viii) | | | + 20 | | – 20 | | | | (01) |
| (ix) | | | | | + 50 | | | | + 50 (02) |
| (x) | | | | | – 2 | | | | – 2 (01) |
| සංශෝධිත ශේෂය | • 4000 | • 360 | • 840 | • 400 | • 1038 | • 180 | • 95 | • 120 | • 6243 |

• අගයන් දෙකකට 1 බැගින් ලකුණු (04) (ලකුණු 20)

(2) **කෙටුම්පත් ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනය**

රු'000

| | | | |
|---|---|---|---|
| කෙටුම්පත් ලාභය | | | 580 |
| එකතු කළා :- භාණ්ඩ විකුණුම් මත හඳුනා නොගත් ලාභය | 200 | (01) | |
| බෙදා හරින ලද භාණ්ඩවල හඳුනා නොගත් ලාභය | 40 | (01) | |
| කපා හළ බොල්ණය ආපසු ලැබීම | 50 | (01) | 290 |
| | | | 870 |
| අඩු කළා :- ක්ෂය | 500 | (01) | |
| කුලී | 80 | (01) | |
| විදුලි ගාස්තු | 5 | (01) | |
| හානි වූ තොග අලාභ | 40 | (01) | (625) |
| නිවැරදි ශුද්ධ ලාභය | | (01) | 245 |

(ලකුණු 08)

(3) පොදු ජර්නලය

රු'000

| | | හර | බැර |
|---|---|---|---|
| (ii) | ලාභාලාභ ගිණුම (කුලී) හර<br>කලින් ගෙවූ කුලී ගිණුම<br>(ප්‍රදර්ශනාගාර කුලිය කලින් ගෙවූ කුලී ගිණුමෙහි ඇතුළත් වීමේ වරද නිවැරදි කිරීම) | 80 | 80 (02) |
| (iii) | ලාභාලාභ ගිණුම (විදුලි ගාස්තු) හර<br>ගෙවිය යුතු විදුලි ගාස්තු ගිණුම<br>(උපචිත විදුලි ගාස්තු සටහන් කිරීම) | 5 | 5 (02) |
| (iv) | ලාභාලාභ ගිණුම (ගැනුම්) හර<br>වෙළෙඳ ගෙවිය යුතු දෑ ගිණුම<br>(ණයට මිලදී ගැනුම් සටහන් නොකිරීම නිවැරදි කිරීම) | 80 | 80 (02) |
| (ix) | මුදල් ගිණුම හර<br>ලාභාලාභ ගිණුම (බොල්ණය ආපසු ලැබීම)<br>(ආපසු ලද කපා හල බොල්ණය සටහන් කිරීම) | 50 | 50 (02) |
| (xi) | ගැනිලි ගිණුම හර<br>මුදල් ගිණුම<br>(අයිතිකරුගේ ගැනිලි සටහන් කිරීම) | 2 | 2 (02) |

සියළු සංලක්ෂයන් සඳහා ලකුණු (02)

(ලකුණු 12)
(මුළු ලකුණු 40)

ප්‍රශ්න අංක 03

| 1 | 2 | 3 | එකතුව |
|---|---|---|---|
| 20 | 08 | 12 | 40 |

ප්‍රශ්න අංක 04

(අ) (1) (i) මුදල් ලැබීම් ජර්නලය රු'000

| දිනය | විස්තරය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණය | | |
|---|---|---|---|---|---|---|
| | | | | අත්පිට විකුණුම් | VAT | ණයගැති ලැබීම් |
| 01/10 | අත්පිට විකුණුම් | | 207 ● | 180 ● | 27 ● | |
| 01/12 | ණයගැතියන්ගෙන් මුදල් ලැබීම් | 10 ● | 110 ● | | | 110 ● |
| 01/30 | ජයමාල් සමාගමෙන් ලැබීම් | | 360 ● | | | 360 ● |
| 01/31 | එකතුව (පොදු ලෙජරයට පිටපත් කළා) (01) | 10 | 677 | 180 | 27 | 470 |

● අයිතම දෙකකට 01 බැගින් ලකුණු (04)

(ii) මුදල් ගෙවීම් ජර්නලය රු'000

| දිනය | විස්තරය | ලද වට්ටම් | වටිනාකම | විශ්ලේෂණය | |
|---|---|---|---|---|---|
| | | | | ණයහිමි ගෙවීම් | වියදම් |
| 01/15 | ණයහිමියන්ට ගෙවීම් | | 70 ● | 70 ● | |
| 01/16 | සීමිත අමල් සමාගමට ගෙවීම් | 5 ● | 225 ● | 225 ● | |
| 01/28 | කාර්යාල වියදම් | | 60 ● | | 60 ● |
| 01/31 | එකතුව (පොදු ලෙජරයට පිටපත් කළා) (01) | 5 | 355 | 295 | 60 |

● අයිතම දෙකකට 01 බැගින් උපරිම ලකුණු (03)

(iii) ගැනුම් ජර්නලය රු'000

| දිනය | සැපයුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| 01/05 | සීමිත අමල් (පුද්ගලික) සමාගම | 200 ● | 30 ● | 230 ● |
| 01/18 | නාදන් වෙළෙන්දෝ | 300 ● | 45 ● | 345 ● |
| 01/31 | එකතුව (පොදු ලෙජරයට පිටපත් කළා) | 500 | 75 | 575 |

● අයිතම තුනකට 01 බැගින් ලකුණු (02)

(ලකුණු 11)

(2) (i) වෙළෙඳ ණයගැති පාලන ගිණුම රු'000

| | | | | | |
|---|---|---|---|---|---|
| 01/01 | ශේෂය ඉ/ගෙ | 120 • | 01/31 | මුදල් ගිණුම | • 470 |
| 01/31 | විකුණුම් ගිණුම | 400 • | 01/31 | දුන් වට්ටම් ගිණුම | 10 • |
| 01/31 | VAT පාලන ගිණුම | 60 • | 01/31 | ශේෂය ප/ගෙ | • 100 |
| | | 580 | | | 580 |

• අයිතම තුනකට 01 බැගින් ලකුණු (02)

(ii) වෙළෙඳ ණයහිමි පාලන ගිණුම රු'000

| | | | | | |
|---|---|---|---|---|---|
| 01/31 | මුදල් ගිණුම | • 295 | 01/01 | ශේෂය ඉ/ගෙ | 70 • |
| 01/31 | ලද වට්ටම් ගිණුම | 5 • | | ගැනුම් ගිණුම | • 500 |
| 01/31 | ශේෂය ප/ගෙ | • 345 | | VAT පාලන ගිණුම | • 75 |
| | | 645 | | | 645 |

• අයිතම තුනකට 01 බැගින් ලකුණු (02)

(iii) VAT පාලන ගිණුම රු'000

| | | | | | |
|---|---|---|---|---|---|
| 01/31 | ණයහිමි පාලන ගිණුම | • 75 | 01/01 | ශේෂය ඉ/ගෙ | 30 • |
| | | | 01/31 | මුදල් ගිණුම | 27 • |
| 01/31 | ශේෂය ප/ගෙ | • 42 | 01/31 | ණයගැති පාලන ගිණුම | 60 • |
| | | 117 | | | 117 |

• අයිතම දෙකකට 01 බැගින් උපරිම ලකුණු (02)

(iv) මුදල් ගිණුම රු'000

| | | | | | |
|---|---|---|---|---|---|
| 01/01 | ශේෂය ඉ/ගෙ | 30 • | 01/31 | ණයහිමි පාලන ගිණුම | • 295 |
| 01/31 | විකුණුම් ගිණුම | 180 • | 01/31 | කාර්යාල වියදම් ගිණුම | 60 • |
| 01/31 | VAT පාලන ගිණුම | 27 • | 01/31 | | |
| 01/31 | ණයගැති පාලන ගිණුම | • 470 | | ශේෂය ප/ගෙ | • 352 |
| | | 707 | | | 707 |

• අයිතම දෙකකට 01 බැගින් උපරිම ලකුණු (03)

(ලකුණු 09)

PADANAMA PUBLICATION

(ආ) (1) **2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් ගිණුම** රු'000

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 80 • | කාර්යාල උපකරණ | 300 • |
| සාමාජික මුදල් | 300 • | වැටුප් | 180 • |
| ඇතුළත් වීමේ ගාස්තු | 140 • | කාර්යාල කුලිය | 10 • |
| පරිත්‍යාග | 20 • | ශේෂය ප/ගෙ | • 50 |
| | 540 | | 540 |

• අයිතම දෙකකට 01 බැගින් ලකුණු (04)

(ලකුණු 04)

(2) **2019 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය** රු'000

| | | |
|---|---|---|
| මුදල් ගිණුමට අනුව ශේෂය (01) | 50 | |
| එකතුකලා : | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | 130 | (02) |
| අඩුකලා : | 180 | |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | (40) | (02) |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය (01) | 140 | |

(ලකුණු 06)

(3) **2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය** රු'000

| | | |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික මුදල් | 350 | (02) |
| ඇතුළත් වීමේ ගාස්තු | 140 | (01) |
| පරිත්‍යාග | 20 | 510 |
| **වියදම්** | | |
| වැටුප් | 210 | (01) |
| කාර්යාල කුලිය | 10 | (01) |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය | 100 | (02) (320) |
| අතිරික්තය | (01) | 190 |

(ලකුණු 08)

පෙරවැඩ රු'000

සාමාජික මුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 40 • | ශේෂය ඉ/ගෙ | 100 • |
| ආදායම් හා වියදම් | 350 • | මුදල් | 300 • |
| ශේෂය ප/ගෙ | 70 • | ශේෂය ප/ගෙ | 60 • |
| | 460 | | 460 |

• අයිතම තුනකට 01 බැගින් 02

පෙරවැඩ රු'000

දේපළ පිරියත හා උපකරණ ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 800 • | ක්ෂය | 100 • |
| මුදල් | 300 • | ශේෂය ප/ගෙ | 1 000 • |
| | 1 100 | | 1 100 |

• අයිතම දෙකකට 01 බැගින් 02

(4) 2019.03.31 දිනට කලින් ලද සාමාජික මුදල් = රු. 70 000 (01)

2019.03.31 දිනට සමුච්චිත අරමුදල = (01) රු. 1 010 000

| පෙරවැඩ | රු'000 |
|---|---|
| 2019.02.28 දිනට සමුච්චිත අරමුදල | 820 |
| මාර්තු මාසය සඳහා අතිරික්තය | 190 |
| 2019.03.31 දිනටසමුච්චිත අරමුදල | 1 010 |

(ලකුණු 02)

ප්‍රශ්න අංක 04

| | 1 | 2 | 3 | 4 | එකතුව |
|---|---|---|---|---|---|
| (අ) | 11 | 09 | - | - | 20 |
| (ආ) | 04 | 06 | 08 | 02 | 20 |
| | | | | | 40 |

ප්‍රශ්න අංක 05

(අ) (1)

**නදී හා ගංගා හවුල් ව්‍යාපාරයේ**

**2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය** රු'000

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | 5 000 | |
| විකුණුම් පිරිවැය | | (2 120) | (02) |
| දළ ලාභය | | 2 880 | |
| වියදම් | | | |
| මෙහෙයුම් වියදම් | 1 135 (01) | | |
| රක්ෂණ ගාස්තු | 300 (01) | | |
| ක්ෂය | 200 | | |
| ණය පොලී | 30 (01) | (1 665) | |
| කාලච්ඡේදයේ ලාභය | | 1 215 | |
| වේතන - නදී | 660 (01) | | |
| ගංගා | 660 | (1 320) | |
| අලාභ කොටස් - නදී | (01) (63) | | |
| ගංගා | (42) | 105 | |

(ලකුණු 07)

| පෙරවැඩ | රු'000 | |
|---|---|---|
| විකුණුම් පිරිවැය | | |
| ගණනය කර ඇති විකුණුම් පිරිවැය | 1800 | |
| සටහන් නොවූ ගැනුම් | 400 | 01 |
| භාණ්ඩ ගැනිලි | (80) | 01 |
| නිවැරදි විකුණුම් පිරිවැය | 2120 | |

(2) **ප්‍රාග්ධන ගිණුම්** රු'000

| | නදී | ගංගා | සාගර | | නදී | ගංගා | සාගර |
|---|---|---|---|---|---|---|---|
| කීර්තිනාමය | 300 | 200 | 100 (01) | ඉඩම් ගිණුම | 1 500 ● | | ● දෙකකට 01 බැගින් උපරිම (02) |
| | | | | ගොඩනැගිලි ගිණුම | 1 000 ● | 1 000 ● | |
| | | | | කාර්යාල උපකරණ ගිණුම | | 1 000 ● | |
| | | | | මුදල් ගිණුම | 500 ● | | |
| | | | | ගැනුම් ගිණුම | | 400 (01) | |
| | | | | මුදල් ගිණුම | | | 1 500 (01) |
| ශේෂය ප/ගෙ | 3 060 | 2 440 | 1 400 | කීර්තිනාමය | 360 | 240 (01) | |
| | 3 360 | 2 640 | 1 500 | | 3 360 | 2 640 | 1 500 |

ජංගම ගිණුම් රු'000

| | නදී | ගංගා | | නදී | ගංගා |
|---|---|---|---|---|---|
| ගැනිලි (භාණ්ඩ) | 80 (01) | | වේතන | (01) 660 | 660 |
| ගැනිලි (ආදායම් බදු) | | 65 (01) | ණය පොලී | (01) 30 | |
| ගැනිලි (රක්ෂණ වාරික) | 200 (01) | | | | |
| මුදල් (ගෙවූ වේතන) | 300 | 500 (01) | | | |
| අලාභ කොටස් | (01) 63 | 42 | | | |
| ශේෂ ප/ගෙ | 47 | 53 | | | |
| | 690 | 660 | | 690 | 660 |

(ලකුණු 13)

(ආ) (1) වාරිකාවේ මුළු ස්ථාවර පිරිවැය = රු. 126 000 (03)

පෙරවැඩ

| | | | | | |
|---|---|---|---|---|---|
| බස් රථ කුලිය | 40 000 | × 3 | = | 120 000 | 01 |
| රියදුරු සහ සහායක දීමනා | 2 000 | × 3 | = | 6 000 | 01 |
| මුළු ස්ථාවර පිරිවැය | | | | 126 000 | |

(ලකුණු 03)

(2) ගුරුවරයෙකුගේ දායකය = රු. 1 260 (03)

පෙරවැඩ

දායකය = $\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{සමච්ඡේදන ඒකක ගණන}}$ = $\frac{\boxed{01}\ 126\ 000}{100\ \boxed{01}}$

= රු. 1 260

(ලකුණු 03)

(3) ගුරුවරයෙකු සඳහා සංග්‍රහ වියදම් = රු. 240 (03)

පෙරවැඩ

විචල්‍ය පිරිවැය = විකුණුම් මිල − දායකය

= 1500 [01] − [01] 1260

= රු. 240

(ලකුණු 03)

(4) වාරිකාවේ ආරක්ෂිත ආන්තික = සංඛ්‍යාව 20 (02)

පෙරවැඩ

ආරක්ෂිත ආන්තිකය (සංඛ්‍යාව) = අපේක්ෂිත සංඛ්‍යාව − සමච්ඡේදන සංඛ්‍යාව

= 120 [01] − 100 [01]

= 20

චාරිකාවේ ආරක්ෂිත ආන්තිකය = රුපියල් 30 000 (02)

පෙරවැඩ

ආරක්ෂිත ආන්තිකය (රුපියල්) = ගුරුවරු ගණන × අයකරන ගාස්තුව
= 20 [01] × 1 500 [01]
= 30 000

විකල්ප පෙරවැඩ

= අපේක්ෂිත ආදායම − සමච්ඡේදන ආදායම
= 120 × 1 500 − 100 × 1 500
= 180 000 [01] − 150 000 [01]
= රු. 30 000

(ලකුණු 04)

(5) අපේක්ෂිත උපරිම ගුරුවරු සංඛ්‍යාව සහභාගි වන්නේ නම් අතිරික්තය = රු. 25 200 (03)

පෙරවැඩ

මුළු ආයකය − ස්ථාවර පිරිවැය
120 × 1 260 − 126 000
[01] 151 200 − [01] 126 000
= රු. 25 200

විකල්ප පෙරවැඩ

ආරක්ෂිත ආන්තිකය × ගුරුවරයෙකුගේ ආයකය
[01] 20 × [01] 1 260
= රු. 25 200

(ලකුණු 03)

(6) ගුරුවරුන් 90ක් පමණක් සහභාගි වන්නේ නම් අයකල යුතු ගාස්තුව = රු. 1 640 (04)

පෙරවැඩ

සමච්ඡේදන ගුරුවරු සංඛ්‍යාව = ස්ථාවර පිරිවැය / ගුරුවරයෙකුගේ ආයකය

90 [01] = [01] 126 000 / (අය කරන ගාස්තුව − [01] 240)

අය කරන ගාස්තුව = රු 1 640

විකල්ප පෙරවැඩ

([01] 126 000 + [01] 21 600) / 90 [01]
= රු. 1 640

(ලකුණු 04)

ප්‍රශ්න අංක 05

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| (අ) | 07 | 13 | - | - | - | - | 20 |
| (ආ) | 03 | 03 | 03 | 04 | 03 | 04 | 20 |
| | | | | | | | 40 |

ප්‍රශ්න අංක 06

(අ) 1. ශුද්ධ ලාභ අනුපාතය = 6.67% / 7% (02)

රු'000

ශුද්ධ ලාභ අනුපාතය $= \frac{\text{වර්ෂය සඳහා ලාභය}}{\text{විකුණුම්}} \times 100$

$= \frac{600 \boxed{01}}{9\,000 \boxed{01}} \times 100 = 6.67\% / 7\%$

(ලකුණු 02)

2. පොලී ආවරණ අනුපාතය = වාර 9 (02)

රු'000

පොලී ආවරණ අනුපාතය $= \frac{\text{බදු පෙර ලාභය + පොලිය}}{\text{පොලිය}}$

$= \frac{640 + 80 \boxed{01}}{80 \boxed{01}}$

= වාර 9

(ලකුණු 02)

3. හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය = 10% (02)

රු'000

හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය $= \frac{\text{වර්ෂය සඳහා ලාභය}}{\text{හිමිකම}} \times 100$

$= \frac{600 \boxed{01}}{6\,000 \boxed{01}} \times 100$

= 10%

(ලකුණු 02)

4. කොටසක ඉපැයුම් අනුපාතය = රු. 4 (02)

රු'000

කොටසක ඉපැයුම් අනුපාතය $= \frac{\text{වර්ෂය සඳහා ලාභය}}{\text{සාමාන්‍ය කොටස් සංඛ්‍යාව}}$

$= \frac{600 \boxed{01}}{150 \boxed{01}}$

= රු. 4

(ලකුණු 02)

5. ණය හිමිකම් අනුපාතය = 0.4 / 40% (02)

රු'000

ණය හිමිකම් අනුපාතය $= \frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}}$

$= \frac{2\ 400}{6\ 000}$ 01 01

= 0.4 / 40%

(ලකුණු 02)

(ලකුණු 10)

(ආ) (1)

රු'000

| | 0 | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|---|
| මුදල් ගලා ඒම් | | | | | | |
| සුන්බුන් අගය | | | | | | 200 (01) |
| කාරක ප්‍රාග්ධනය | | | | | | 300 (01) |
| මෙහෙයුම් පිරිවැය ඉතිරිය | | 500 | 500 | 500 | 500 | 500 (01) |
| පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල | 400 (01) | | | | | |
| | 400 | 500 | 500 | 500 | 500 | 1000 |
| මුදල් ගලා යෑම් | | | | | | |
| නව යන්ත්‍ර ගැනුම් මිල | (1 200) (01) | | | | | |
| ස්ථාපනය කිරීමේ ගාස්තු | (75) | | | | | |
| වැඩබිම සකස් කිරීමේ වියදම් | (125) | | | | | |
| නඩත්තු පිරිවැය | - | (100) | (100) | (100) (01) | (100) | (100) |
| කාරක ප්‍රාග්ධනය | (300) (01) | | | | | |
| | (1 300) | 400 | 400 | 400 | 400 | 900 |

ශුද්ධ වර්තමාන අගය = + 429 000 (02)

පෙරවැඩ රු'000

| මුදල් ප්‍රවාහය | | වට්ටම් සාධකය | | |
|---|---|---|---|---|
| (1 300) | × | 1 | = | (1 300) |
| 400 | × | 0.89 | = | 356 |
| 400 | × | 0.80 | = | 320 |
| 400 | × | 0.71 | = 01 | 284 |
| 400 | × | 0.64 | = | 256 |
| 900 | × | 0.57 | = | 513 |
| ශුද්ධ වර්තමාන අගය | | | | 429 |

(2) (01) ශුද්ධ වර්තමාන අගය ධන අගයක් ගන්නා බැවින් යන්ත්‍රය මිලට ගැනීම යෝග්‍ය වේ.

(ලකුණු 10)

(ඉ)

## සීමිත නිහාල් පොදු සමාගම

### 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ | රු'000 | රු'000 |
| ගනුදෙනුකරුවන්ගෙන් ලද මුදල් | 1 100 (02) | |
| සැපයුම්කරුවන්ට සහ සේවකයන්ට ගෙවූ මුදල් | (625) (04) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් | 475 | |
| ගෙවූ පොලී | (20) (01) | |
| ගෙවූ ආදායම් බදු | (75) (01) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් (01) | | 380 |
| ආයෝජන ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහ | | |
| දේපල, පිරියත සහ උපකරණ විකුණුම් | 250 (01) | |
| දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනුම් | (410) (03) | |
| ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් (01) | | (160) |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහ | | |
| කොටස් නිකුතුවෙන් ලද මුදල් | 400 (01) | |
| ගෙවූ ලාභාංශ | (60) (01) | |
| ණය ගෙවීම් | (220) (01) | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් (01) | | 120 |
| කාලච්ඡේදය සඳහා වූ ශුද්ධ මුදල් වැඩිවීම | (01) | 340 |
| 2018.03.31 දිනට මුදල් සහ මුදල්, සමාන දෑ | | 120 |
| 2019.03.31 දිනට මුදල් සහ මුදල්, සමාන දෑ | (01) | 460 |

PADANAMA PUBLICATION

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්
**සිංහල මාධ්‍ය**

**විද්‍යා - ගණිත**

- 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- 12-13 රසායන විද්‍යාව - 1
- 12-13 රසායන විද්‍යාව - 2
- 12-13 රසායන විද්‍යාව - 3
- 12-13 රසායන විද්‍යාව - 4
- 12-13 රසායන විද්‍යාව - 5
- 12-13 භෞතික විද්‍යාව - 1
- 12-13 භෞතික විද්‍යාව - 2
- 12-13 භෞතික විද්‍යාව - 3
- 12-13 භෞතික විද්‍යාව - 4
- 12-13 භෞතික විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 1
- 12-13 ජීව විද්‍යාව - 2
- 12-13 ජීව විද්‍යාව - 3
- 12-13 ජීව විද්‍යාව - 4
- 12-13 ජීව විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- 12-13 කෘෂි විද්‍යාව - 1
- 12-13 කෘෂි විද්‍යාව - 2
- 12-13 කෘෂි විද්‍යාව - 3
- 12-13 කෘෂි විද්‍යාව - 4

**වාණිජ්‍යය**

- 12 ගිණුම්කරණය
- 13 ගිණුම්කරණය
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 13 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව
- 13 ආර්ථික විද්‍යාව - 1
- 13 ආර්ථික විද්‍යාව - 2

**කලා**

- 12 සිංහල
- 13 සිංහල
- 12 දේශපාලන විද්‍යාව
- 13 දේශපාලන විද්‍යාව
- 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- 12 ඉන්දියානු ඉතිහාසය
- 13 ඉන්දියානු ඉතිහාසය
- 12 භූගෝල විද්‍යාව
- 13 භූගෝල විද්‍යාව
- 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes
**English Medium**

- 12 Accounting
- 13 Accounting
- 12 Business Studies
- 13 Business Studies
- 12 Economics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර
**සිංහල මාධ්‍ය**

- සාමාන්‍ය දැනීම
- 12 ගිණුම්කරණය - 1
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.

+94 71 800 8533 / +94 77 088 2228

WWW.PADANAMAPUBLICATION.LK